ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## පුවත්පත් නිවේදනය

### වැඩබලන ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා හමු වෙයි

ශ්‍රී ලංකාවේ වැඩබලන ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා අද දින කොළඹදී විදේශ අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා හමු විය. මෙහිදී වැඩබලන මහ කොමසාරිස්තුමා ඉන්දියාව කොවිඩ්-19 වසංගත තත්වය පාලනය කිරීමට ගන්නා ප්‍රයත්නයන් පිළිබඳව විදේශ අමාත්‍යතුමා දැනුවත් කළේය. අමාත්‍යතුමාද මෙම ගෝලීය වසංගතයට එරෙහිව සටන් කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර සම්බන්ධයෙන් වැඩබලන මහ කොමසාරිස්තුමා දැනුවත් කළේය.

අමාත්‍යතුමා සහ වැඩබලන මහ කොමසාරිස්තුමා කොවිඩ් 19 වෛරසයට එරෙහිව ගන්නා ද්විපාර්ශවික ප්‍රයත්නයන් පිළිබඳව සතුට පළ කළ අතර තවදුරටත් මේ සම්බන්ධයෙන් එක්ව කටයුතු කිරීමට එකඟතාවය පළ කළෝය. සියලු රටවල් මෙම වසංගත තත්වයට ඒ ඒ රටවලට අනන්‍ය ආකාරයෙන් මුහුණදෙන නමුත් වසංගතයෙන් අනතුරුව ආර්ථිකය යළි නඟා සිටුවීමේදී සැලකිය යුතු සාමූහික ප්‍රයත්නයක් දැරිය යුතු බව මෙම දෙපළ පැවසුවේය.

විදේශ අමාත්‍යතුමා මාර්තු මාසයේදී ඉන්දියාවේ අතරමංව සිටි වන්දනාකරුවන් නැවත ශ්‍රී ලංකාවට රැගෙන ඒම සඳහා ඉන්දියාව දැක්වූ සහයෝගයට ස්තූතිය පළ කළ අතර අප්‍රේල් මස මුලදී ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලද ටොන් 13කට වැඩි ජීවිත සුරකින අත්‍යාවශ්‍ය ඖෂධ තොගය සම්බන්ධයෙන්ද සිය කෘතඥතාවය පළ කළේය. එසේම ඉන්දියාවේ සිටින ශ්‍රී ලාංකික සිසුන් ගෙන්වා ගැනීමට ඉන්දියාවේ සහයෝගය පතන බව අමාත්‍යතුමා ප්‍රකාශ කළේය.

අමාත්‍යතුමා සහ වැඩබලන මහ කොමසාරිස්තුමා දෙරට අතර ද්විපාර්ශවික සම්බන්ධතා පිළිබඳවද සාකච්ඡා කළ අතර අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් 2019 නොවැම්බර් මාසයේදී ද, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2020 පෙබරවාරි මාසයේදී ද ගරු විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 2020 ජනවාරි මාසයේදීද සිදු කළ ඉන්දීය සංචාරයන් අතරතුර ඇති කරගත් අවබෝධතා ඉදිරියට ගෙනයාමට එකඟත්වය පළ කළෝය.

කොළඹ

2020 අප්‍රේල් 20

*****